# සියදිවි නසාගැනීමේ ප්‍රවෘත්ති වාර්තාකරණය සහ එහි සමාජ බලපෑම (පුවත්පතට විශේෂිතව කරනු ලබන අධ්‍යයනයක්)

නයනා සුරවීර

nayana.suraweera214@gmail.com

යම් පුද්ගලයෙකු හිතාමතාම තම කැමැත්තෙන් යම් උපක්‍රමයක් තමන් විසින්ම ක්‍රියාත්මක කොට එකී උපක්‍රමය හේතුවෙන්ම සිය තොර කර ගැනීම සියදිවි නසා ගැනීම ලෙස අර්ථකතනය කළ හැකිය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවට අනුව 2016 වසරේදී ලංකාවේ සියදිවි නසා ගැනීම් අනුපාතය 21. 3 (- 10 000 ට) කි. සාමාන්‍ය වශයෙන් යම් රටක ජන සනත්වයෙන් පුද්ගලයන් ලක්ෂයකට දහඅට දෙනෙකු සිය දිවි තොරකර ගන්නේ නම් එකී රට සිය දිවි නසා ගැනීම් ඉහළ අගයක් පෙනුන්ම් කරනු ලබන බැව් ප්‍රකාශිතය. එහිදී ලංකාව නිතරම සෑම වර්ෂයකම පාහේ අදාළ ප්‍රතිශතාත්මක අගයට වඩා ඉහළ අගයක් ගනු ලබන අතර එය රටේ විවිධ සමාජ ගැටලු හා අභියෝග අතර ප්‍රමුඛතම ගැටලුවක් බවට පත්ව ඇත. විශේෂයෙන් අදාළ ගැටලුව තව දුරටත් වර්ධනය කිරීම උදෙසා මාධ්‍ය විසින් සදාචාර නොවන ආකාරයෙන් සිය දිවි නසා ගැනීම් වාර්තා හේතු වන බවට මාධ්‍යට චෝදනා එල්ල වී තිබේ. රටක සිව්වැනි ආණ්ඩුව ලෙස විරුදාවලිය ලබා ඇති මාධ්‍ය විසින් සිය ආචාරධර්මයන් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කරමින් සමාජයේ විසදිය යුතු ප්‍රමුඛතම ගැටලුවක් තව දුරටත් ගැටලුවක් ලෙසම වර්ධනය කරන්නේනම් ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. එබැවින් අදාළ අධ්‍යනයෙන් සොයා බැලෙනුයේ සියදිවි නසා ගැනීම් වාර්තා කිරීමේදී පුවත්පත කටයුතු කර ලැබ ඇති ආකාරය සහ එහි වන සමාජ බලපෑම පිළිබඳවය. පර්යේෂණ ගැටලුව තුළින් අධ්‍යයනය කරනු ලැබූයේ පුවත්පත් සියදිවි නසා ගැනීමේ ප්‍රවෘත්ති වාර්තා කිරීමේදී සිදු කරනු ලබන්නේ කවර සමාජ බලපෑමක්ද යන්නය. අදාළ අධ්‍යයනයට අවශ්‍ය දත්ත රැස් කර ගැනීම උදෙසා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යොදා ගනු ලැබූ අතර එහිදී 2017 වසරට විශේෂිතව ලාංකීය පුවත්පත් සියදිවි නසා ගැනීම් වාර්තාකරණය කරනු ලැබූ ආකාරය ස්වයං විමර්ශනයකට ලක් කරනු ලැබීය. සිය දිවි නසා ගැනීම් වාර්තාකරණයේදී මාධ්‍ය සිය ආචාරධර්මයන් පැහැදිලි ලෙසම උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කරන අතර එය සමාජය තුළ අදාළ ගැටලුව තව දුරටත් තහවුරු කිරීමට සහ අනුකරණාත්මක සියදිවි නසා ගැනීම් සඳහා දිරි දීමක් සිදු කරනු බැව් අධ්‍යයන නිගමනය විය.

**ප්‍රමුඛ පදඃ** සියදිවි නසාගැනීම; සමාජ බලපෑම; මාධ්‍ය වාර්තාකරණය; සමාජ ගැටලු, මාධ්‍ය ආචාරධර්ම